# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 628 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 12/04/2024 පැය 0550

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - අක්කරපත්තුව පොලිස් වසම.**

2024.04.10 වන අද දින උදෑසන කාලයේ අක්කරපත්තුව පොලිස් වසමේ කෝලාවිල් 02 ප්‍රදේශයේ නිවසක් ගිනි ගෙන පුද්ගලයෙකු මියගොස් ඇති බවට අක්කරපත්තුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ කෝලාවිල් 02 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිවසේ පොල්අතු වලින් සෙවිලි කරන ලද මුළුතැන්ගෙයි කොටසක මෙම පුද්ගලයා පිළිස්සී මියගොස් සිට ඇති අතර මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු 2024.04.11 වන දින අක්කරපත්තුව රෝහලේදී පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව ගෙල කැපීම හේතුවෙන් අධික ලෙස රුධිරය වහනය වී මෙම මරණය සිදුව ඇති බවට දන්වා ඇත. ඒ අනුව මෙම ඝාතනය සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී මරණකරුගේ බිරිඳ හා ඇය සමඟ අනියම් සම්බන්ධතාවයක් පැවැත් වූ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක් හා සැකකාරිය වයස අවුරුදු 33 ක් වන කෝලාවිල් 02 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරය අක්කරපත්තුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - ඌරගස්මංහන්දිය පොලිස් වසම.**

2024.04.11 වන දින උදෑසන කාලයේ ඌරගස්මංහන්දිය පොලිස් වසමේ ඌරගස්මංහන්දිය ප්‍රදේශයේදී කාන්තාවක් නිවසක් තුළ කපා කොටා දමා බිම වැටී ඇති බවට ඌරගස්මංහන්දිය පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 41 ක් වූ ගල්තුඩුව, මීරිස්වත්ත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය හා ස්වාමි පුරුෂයා අතර ඇති වූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් ස්වාමි පුරුෂයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමර්ශනයේදී තොරතුරු අනාවරණය වී ඇත. ඒ අනුව මෙම ඝාතනයට සම්බන්ධ මරණකාරියගේ ස්වාමි පුරුෂයා අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වූ වතුරුවෙල, කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පශ්වාත් මරණ පරීක්ෂණ පවත්වා මෘත දේහය ඥාතීන්ට භාර දී ඇත. ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. රාත්‍රී කාලයේ නිවසකට ඇතුලු වී දේපල හා මුදල් කොල්ලකෑමකට අදාල සැකකරුවන් හය දෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - අරලගංවිල පොලිස් ස්ථානය.**

2024.04.10 වන දින රාත්‍රී කාලයේ අරලගංවිල පොලිස් වසමේ අලවාකුඹුර ප්‍රදේශයේදී නාඳුනන පුද්ගලයින් පිරිසක් වෑන් රථයකින් පැමිණ නිවසකට ඇතුළු වී නිවැසියන් බියගන්වා මුදල්, රන් භාණ්ඩ හා වායු රයිෆලයක් කොල්ලකෑම සම්බන්ධව අරලංගවිල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

සිද්ධිය වන අවස්ථාවේ නිවසේ හිමිකරුගේ බිරිඳ පමණක් නිවසේ සිට ඇති අතර නාඳුනන පිරිසක් සුදුපාට වෑන් රථයකින් පැමිණ පැමිණිලිකාරියට පහරදී බියගන්වා මුදල් හා දේපල කොල්ලකා පලාගොස් ඇත.

පැමිණිල්ල ලද පසු අවට පොලිස් ස්ථාන දැනුවත් කිරීමෙන් අනතුරුව මහියංගනය පොලිස් ස්ථානය මඟින් පවත්වා ගෙන යනු ලබන මාර්ග බාධකයකදී සැකසහිත වෑන් රථයක් පරික්ෂා කිරීමේදී වායු රයිෆලයක් තිබී හමුවී ඇත. ඒ අනුව වෑන් රථයේ සිටි සැකකරුවන් හය දෙනෙකු හා සැකකාරියක් වෑන් රථය සමඟ මහියංගනය පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සිදු කිරීමේදී අරලගංවිල පොලිස් වසමේ නිවසකට අයුතු ලෙස ඇතුලු වී දේපල හා මුදල් කොල්ලකෑමේ අපරාධයට අදාල සැකකරුවන් බවට කරුණු අනාවරණය වීමෙන් පසු සැකකරුවන් හා දේපල අරලගංවිල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 40, 45, 49, 58 හා 63 වයස්වල පසුවන මාකුඹුර, දංබොක්ක, දවුලගල, පැලැටියාව, බෝපිටිය හා කටුපොත ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 41 ක් වන නාරංගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

කොල්ලකන ලද දේපල වලින් රන් මාල 02 ක්, රන් පෙන්ඩනයක්, වායු රයිෆලයක්, ජංගම දුරකතනයක් හා මුදල් රුපියල් 79,000/= ක් පොලිසිය විසින් සොයා ගෙන ඇත.

අරලගංවිල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.04.11 වන දින උදෑසන කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ සමාධි විහාරස්ථානය අසලදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 13 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මාලිගාවත්ත, කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලිගාවත්ත පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරවැව පොලිස් ස්ථානය.**

2024.04.11 වන දින රාත්‍රී කාලයේ මොරවැව පොලිස් වසමේ ඇතාබැදිවැව ප්‍රදේශයේදී මොරවැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන රොටවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අඹන්පොල පොලිස් ස්ථානය.**

2024.04.11 වන දින සවස් කාලයේ අඹන්පොල පොලිස් වසමේ කාසිකොටේ ප්‍රදේශයේදී අඹන්පොල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කාසිකොටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සෙට්ටිකුලම පොලිස් ස්ථානය.**

2024.04.11 වන දින සවස් කාලයේ සෙට්ටිකුලම පොලිස් වසමේ තුට්ටුවායි ප්‍රදේශයේදී සෙට්ටිකුලම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 17 ක් වන නේරියකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සෙට්ටිකුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.**

2024.04.11 වන දින සවස් කාලයේදී බගවන්තලාව පොලිස් වසමේ කැම්පියන් වත්ත ප්‍රදේශයේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු මැණික් ගැරීම සඳහා උපයෝගී කරගත් උපකරණද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38, 50 හා 76 යන වයස්වල පසුවන ලිඳුල හා බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - වැලිගෙපොල පොලිස් වසම.**

2024.04.11 වන දින දහවල් අළුයම් කාලයේ වැලිගෙපොල පොලිස් වසමේ වැලිගෙපොල පල්ලේබැද්ද මාර්ගයේ කුඩා කන්ද ප්‍රදේශයේදී වැලිගෙපොල දෙස සිට මැදගංඔය දෙසට ධාවනය වූ බස් රථයක ගමන්ගත් කාන්තාවක් බසයෙන් බැස බස් රථය ඉදිරියෙන් පාරු මාරුවීමට යන අවස්ථාවේදී බස් රථයේ ඉදිරිපස ගැටී විසි වී ගොස් බස් රථයේ පිටුපස රෝදයට යට වී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව වැලිගෙපොල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 61 ක් වූ පිටකන්ද, වැලිගෙපොල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වැලිගෙපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සිදුකල බස් රථයේ රියදුරු සහ රිය සහයක අත්අඩංගුවට ගෙන ඇත. වැලිගෙපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - මහනුවර පොලිස් වසම.**

2024.04.11 වන දින උදෑසන කාලයේ මහනුවර පොලිස් වසමේ බෝගම්බර බස් රථ පර්යන්තයේ සිට පේරාදෙනිය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මහනුවර පොදු වෙළඳ සංකීර්ණය අසලදී මාර්ගය හරහා ගමන් කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 64 ක් වූ තලාතුඔය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**11. මාරක රිය අනතුරක් - කොස්ගම පොලිස් වසම.**

2024.04.11 වන දින සවස් කාලයේ කොස්ගම පොලිස් වසමේ කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ සාලාව ප්‍රදේශයේදී කොළඹ දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් වෙනත් රථයකට ඉස්සර කිරීමට යාමේදී යතුරුපැදිය පෙරළී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු සාලාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ ගලිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කොස්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - පුනරීන් පොලිස් වසම.

2024.04.11 වන දින රාත්‍රී කාලයේ පුනරීන් පොලිස් වසමේ යාපනය මන්නාරම මාර්ගයේ 04 කණුව ප්‍රදේශයේදී මන්නාරම දෙස සිට යාපනය දෙසට ධාවනය වූ කාර් රථයක් ඊට පිටුපසින් එම දිශාවටම ඉදිරියෙන් ධාවනය වූ යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු පුනරීන් රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ පුනරීන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කිළිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු කාර් රථය පලායමින් සිටියදී පුනරීන් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් රියදුරු හා රථයේ ගමන් ගත් පුද්ගලයින් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර පුනරීන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**